## රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

### ජනතා වතු සංවර්ධන මණ්ඩලය

### ඇබෑර්තු

ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. තෝරාගන්නා ලද අයදුම්කරුවන් රජය විසින් නිකුත් කරන ලද හා ඉදිරියේදී නිකුත් කිරීමට අපේක්ෂිත අණ පනත් හා ආයතනික නීති රීති, රෙගුලාසි හා ප්‍රතිපත්ති වලට අනුකූලව තනතුරට අදාළ කාර්යයන් ඉටුකිරීමට මනා හැකියාවක් ඇති අය විය යුතුය.

**සහකාර අභ්‍යන්තර විගණක - 01**

**සුදුසුකම්**

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකරණය, වාණිජවේදී, ව්‍යාපාර පරිපාලනය, මූල්‍ය කළමනාකරණය, ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උපාධියක් හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක් ලබා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම.

**සේවා ශ්‍රේණිය : කණිෂ්ඨ කළමනාකාර**

වැටුප් තලය : JM 1-1 - රු. (42,600 – 10 x 755 -18 x 1,135 – 70,580)
වයස : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩිවිය යුතුය.

**කළමනාකරණ සහකාර - 01**
**සුදුසුකම්**

අ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේදී
   i සිංහල/දෙමළ
   ii ගණිතය
   iii ඉංග්‍රීසි යන විෂය ඇතුලුව විෂයයන්(04) කට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් 06කින් සමත්ව තිබීම.

ආ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උ.පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (03) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

සේවා ශ්‍රේණිය : කළමනාකාර සහකාර තාක්ෂණික නොවන
වැටුප් තලය : MA 1-1 රු.(27,910- 10 x 300 – 7 x 350 – 4 x 495 – 20 x 660 – 48,540)
වයස : අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩිවිය යුතුය.

**පොදු**

**පත්වීමේ ස්වභාවය** ස්ථිර සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිතයි.

**සෑම අයදුම්කරුවෙකුම,** i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරී කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
iii. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.
iv. අනුමත බඳවා ගැනීමේ පටිපාටිය අනුව සියළුම අවශ්‍යතාවයන් සපුරාලිය යුතුය.

සුදුසුකම් ඇති අයදුම්කරුවන් සඳහා සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසු නිලධාරීන් තෝරාගනු ඇත. අයදුම්කරු පිළිබඳ තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නාමද සහිතව සකස් කරන ලද අයදුම්පත 2024.05.31 වන දින හෝ ඊට ප්‍රථම කළමනාකරු - මානව සම්පත්, ජනතා වතු සංවර්ධන මණ්ඩලය, 55/75, වොක්ෂෝල් පටුමග, කොළඹ 02 යන ලිපිනයට තැපැලෙන් එවිය යුතු අතර ඉල්ලුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙලවරේ සඳහන් කල යුතුය.

සභාපති
ජනතා වතු සංවර්ධන මණ්ඩලය
2024.05.16